සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## පෙරදිග සංගීතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වල දී ඇති වරණ අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. "ඇහැළ මහට ඇහැළ ගහක" මෙම ස්වර ස්ථාපන ගී පාදය ට නියමිත නිවැරදි ස්වර පාදය කුමක්ද?
   i /ස්ස්ධ/සස-/රිසරි/ග--/ ii /සරිග/රිගප/ගපධ/ස්--/
   iii /ස්ස්ධ/පගග/රිගරි/සසරි/ iv /ස්ධප/ධපග/පගරි/ස--/

2. මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාල දෙක සඳහන් පිළිතුර කුමක්ද?
   i ජප් - කහෙර්වා ii ජප් - දීප්චන්දි
   iii දීප්චන්දි - ත්‍රිතාල් iv දාදරා - ජප්

3. ගීතයක නාද මාලාව හැඳින්වෙන්නේ කෙසේද?
   i Introduction ii Chorus iii Counter iv Melody

4. /රන්/වන්ක/රල්/සැලෙයි/ මෙම ගී පාද ප්‍රස්තාරයට ගැලපෙන තිත් රූපය වන්නේ කුමක්ද?
   i සුළු මැදුම් දෙතිත ii සුළු තනිතිත iii මැදුම් මහ දෙතිත iv මැදුම් තනිතිත

5. බටහිර සංගීතයේ ප්‍රස්තාරකරණයේදී යොදාගන්නා 𝅗𝅥 මෙම සංකේතයේ නම හා වටිනාකම සඳහන් පිළිතුර තෝරන්න.
   i ක්‍රොචට් - 1 ii සෙමිබ්‍රිව් - 4 iii මිනිම් - 2 iv ක්වේවර් - ½

අංක 6 සිට 10 දක්වා ඇති ප්‍රශ්න වලට වරහන් තුල දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(ගීමත්/උපදේශාත්මක ගී/intro/Inter/Pick/මිස්රාබ්/භජන් ගී/මව්පිය ගුණ/සඳැස්මත්/අලුව)

6. ගී පාදයක ලඝු ගුරු අකුරුවල එකතුව ........................ නම් වේ.
7. ........................ දෙවියන්ගේ ගුණ වර්ණනා කෙරෙන ගායන ශෛලියකි.
8. "අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී" ගීතය ........................ ඇතුළත් සරල ගීයකි.
9. ගීතයක, ආරම්භක වාදනය (පෙර වාදනය) ........................ යනුවෙන් හඳුන්වයි.
10. ........................ නම් උපකරණයෙන් සිතාරය වාදනය කරනු ලැබේ.

අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් හරි (√) ලකුණද, වැරදි නම් (x) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

11. නෙළුම් ගී සමාජ ගී ගණයට අයත් වේ. ( )
12. "එබෝ සතුනි වනේ" මෙම ගීපාද යේ සැඳැස්මත් ගණන නවයකි. ( )

13. තාලම්පටින් නිකුත් වන තෙයි යන ධ්වනිය "^" මෙම සංකේතයෙන් සංකේතවත් කරයි. ( )
14. දාදරා තාලය ආවර්ථ දෙකක් වාදනය කළ විට ලැබෙන මාත්‍රා ගණන 12 කි. ( )
15. ගැමි ගී මුඛපරම්පරාවෙන් පැවත එන්නකි. ( )

A කොටසේ සඳහන් ගීත වර්ගය B කොටසින් තෝරා යා කරන්න.


| | A | B |
|---|---|---|
| 16. | සිරි සරු සාරකෙතේ ගොයම් පැසීලා මහිමේ | නෙළුම් ගීයකි |
| 17. | රිදියෙන් තනලා රත්රන් ඔපලා | සරළ ගීයකි |
| 18. | ඉරු දෙවියෝ වැඩිය තැනේ | තුන්සරණේ ගීයකි |
| 19. | ඉපල් පිටින් ගහන අච්ච | කමත් ගීයකි |
| 20. | බුද්ධං සරණේ සිරස දරාගෙන | ගොයම් ගීයකි |

මුළු ලකුණු 20


# II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත A හා B රූප සටහන්වල දක්වා ඇත්තේ නිර්දේශිත රාග දෙකක ආරෝහණ අවරෝහණ වලට අයත් ස්වර වේ.




A




B

i ඉහත A හා B රූප සටහන් දෙකෙහි ඇතුළත් නිර්දේශිත රාග දෙකෙහි නම් අදාල ඉංග්‍රීසි අකුරු සමඟ ලියා දක්වන්න. ල 02

ii ඔබ විසින් නම් කරන ලද රාග දෙකේ ආරෝහණ හා අවරෝහණ රාග වල නම ඉදියෙන් ලියා දක්වන්න. ල 02

iii ඉහත සඳහන් රාග දෙකෙන් එකක ස්වර ස්ථාපන ගීතයට අයත් ස්ථායි කොටස ගීතස්වර ප්‍රස්තාර කරන්න. ල 04

iv ඉහත ඔබ විසින් ප්‍රස්තාර කළ ගීතයට ගැලපෙන හින්දුස්ථානී තාලය නම් කරන්න. ල 02

එකතුව 10

02. i මාත්‍රා දහයකින් හා දාහතරකින් යුතු හින්දුස්ථානි තාල දෙක පිළිවෙලින් නම් කරන්න. ල 02

ii එම තාල දෙකට අනුව ගැයෙන ගී පාදයක් බැගින් ලියා දක්වන්න. ල 04

iii ඉහත තාල දෙකෙන් කැමති එක් තාලයක ඨේකාව නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. ල 04

එකතුව 10

03. “ගැමි ගී” දේශීය අනන්‍යතාවය විදහා දක්වන සංස්කෘතිකාංගයකි.

i ගැමි ගී වර්ගීකරණය කරන ආකාර තුන ලියා දක්වන්න. ල 03

ii ඉහත වර්ගීකරණය සඳහා උදාහරණ එක බැගින් ලියන්න. ල 03

iii ගැමි ගී වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ හතරක් ලියා දක්වන්න. ල 04

එකතුව 10

04. i නූර්ති හා නාඩගම් නිර්මාණය කළ පුරෝගාමීන් එක් අයෙකු බැගින් පිළිවෙලින් නම් කරන්න. ල 02

ii නූර්තියක හෝ නාඩගමක නම ලියා එම ගීතයේ මුල් කොටස ලියා දක්වන්න. ල 04


iii නූර්ති හා නාඩගම් සඳහා යොදාගන්නා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ දෙක පිළිවෙලින් ලියන්න. ල 02

iv ඉහත රංග ශෛලීන් දෙකට ආභාසය කරගත් සංගීත පද්ධති දෙක වෙන වෙනම ලියා දක්වන්න. ල 02

එකතුව 10

05. i පහත දැක්වෙන පෙරදිග ස්වර ප්‍රස්තාරය බටහිර රේඛා මණ්ඩලය මත ලියා දක්වන්න
/පපමම/ගගරිරි/සරිගම/ප---/ ල 04

ii පහත බටහිර ස්වර ප්‍රස්තාරයේ අඩංගු A සිට F දක්වා සළකුණුකර ඇති සංකේත අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග ලියා දක්වන්න. ල 06



සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

# පෙරදිග සංගීතය – පිළිතුරු

## I කොටස

1. iii
2. ii
3. iv
4. i
5. iii
6. සඳැස්මත්
7. භජන් ගී
8. පියගුණ ගී
9. Intro
10. මිස්රාබ්
11. x
12. √
13. x
14. √
15. √
16. සරල ගී
17. ගොයම් ගී
18. කමත් ගී
19. නෙළුම් ගී
20. තුන්සරණේ ගී

## II කොටස

01. i A - සරිගපධසං / සංධපගරිස
B - සරිගමපධනිසං / සංනිධපමගරිස — ල 02
ii A - භූපාලි B - බිලාවල් — ල 02
iii භූපාලි, බිලාවල් රාග දෙකෙන් එක් රාගයක ස්ථායි කොටසේ ගීත ස්වර ප්‍රස්තාරය ලියා දැක්වීමට — ල 04
iv අදාළ හින්දුස්ථානි තාලය නම් කිරීමට — ල 02

02. i ඣප් තාලය හා දීප්චන්දි තාල දෙක පිළිවෙලින් නම් කිරීමට — ල 02
ii ගීත පාද දෙක බැගින් නම් කිරීමට — ල 04
iii ප්‍රස්තාර කරනු ලබන තාලයේ ඨේකාව නියමිත තාල සංඥා සමග ලියා දැක්වීමට — ල 04

03. i * වෘත්තීන් මත * ඇදහිලි හා විශ්වාස මත * විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත — ල 03
ii උදාහරණ දෙක බැගින් ලියා දැක්වීමට — ල 03
iii ගැමි ගීයේ සුවිශේෂී ලක්ෂණ 4ක් ලියා දැක්වීමට — ල 04

04. i නූර්ති - සී දොන් බස්තියන්/ජෝන්ද සිල්වා/චාර්ල්ස් ඩයස්
නාඩගම් - පිලිප්පු සිංඤෝ/චාර්ල්ස් ගුණසිංහ — ල 04
ii නූර්ති හා නාඩගම් නාට්‍ය එක බැගින් නම් කිරීමට — ල 02
iii තබ්ලාව, මද්දලය — ල 02
iv නූර්ති - උතුරු ඉන්දියානු සංගීතය / හින්දුස්ථානි සංගීතය
නාඩගම් - දකුණු ඉන්දිය සංගීතය / කර්ණාටක සංගීතය — ල 02

05. i බටහිර රේඛා මණ්ඩලයක නියමිත විභාග 4 ප්‍රස්තාර කිරීමට — ල 04
ii A සිට F දක්වා වූ සංකේත 6 නම් කිරීමට — ල 06

| | | |
|---|---|---|
| A. - staff | B. Treble clef (G) | C. crotchet |
| D. - Bar line | E. Minim | F. Semibrave |

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## පෙරදිග සංගීතය - (ප්‍රායෝගික පරීක්ෂණය)

සැලකිය යුතුයි
* ඇගයීම් දිනට ප්‍රථම සිසුන් දැනුවත් කරන්න.
* කේවලව ඇගයීම සිදුකරන්න

01. භූපාලි රාගයේ ස්වර ස්ථාපන ගීතය ගායනය කරන්න ළ 10

02. නූර්ති, නවනාට්‍ය, භජන් යන ගීත අතුරින් එකක මුල් කොටස ගායනය/වාදනය කරන්න ළ 05

03. ගොයම් හෝ නෙළුම් ගීයක් ගායනය කරන්න ළ 10

04. ගුරුවරයා නම් කරනු ලබන නිර්දේශිත හින්දුස්ථානි තාල පදයක් අතින් තාල යොදා පෙන්වන්න ළ 05

05. තෝරාගත් වාද්‍ය භාණ්ඩයකින් කැමති ගිතයක් වාදනය කරන්න ළ 10

06. යතුරු පුවරුවෙන් කෝමල ග නි ස්වර ස්ථාපන ගීතයක් වාදනය කරන්න ළ 10

මුළු ලකුණු 50